සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

**පළමු වාර පරීක්ෂණය 2018** **11 ශ්‍රේණිය**
**முதலாம் தவணைப் பரீட்சை 2018** **தரம் 11**
**First Term Test 2018** **Grade 11**

**කතෝලික ධර්මය -I කොටස**
**Catholic**

**පැය තුනයි**
***Two hours***

පහත ප්‍රශ්න වලට ඉතාමත් ගැලපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න

1. පුරාණ ගිවිසුමේ ජනවන්දනාවට අදාල නීති නියෝග පිළිබඳව කරුණු ඇතුලත් වන්නේ පහත ග්‍රන්ථ අතරින් කුමක් තුළ ද ?

   I). නික්මයාම II). ද්විතිය නීති සංග්‍රහය III). ලෙවි ව්‍යවස්ථාව IV). උත්පත්ති

2. "ටෝරා"යන හේබ්‍රෙව් වචනයේ අර්ථය වන්නේ,

   I). ව්‍යවස්ථාව නොහොත් නීතියයි. II). නීතිය නොහොත් ඉගැන්වීමයි.

   III). ඉගැන්වීම නොහොත් සම්ප්‍රදායයි. IV). ව්‍යවස්ථාව නොහොත් ඉගැන්වීමයි.

3. කතෝලික ශු.බයිබලයේ පුරාණ ගිවිසුමේ සම්මත ග්‍රන්ථ ලැබී ඇත්තේ,

   I). සෙප්ටුවාජින්තයෙනි. II). හේබ්‍රෙව් පිටපතෙනි.

   III). ජුදා මූලාශ්‍රයෙනි. IV). මැසොරෙටික් පිටපතෙනි.

4. ශු.බයිබලයේ සඳහන් දේශක දිවැසිවරුන් පමණක් ඇතුලත් වන පිළිතුර වන්නේ,

   I). නාහුම්,මීකායා,අහියා, ඒලියා II). මීකා,හුල්දා,ඒලීෂා,නාතාන්

   III). නාතාන්,අහියා,හුල්දා,මීකායා IV). ඒලීසා,ඒලියා,මලාකි,හුල්දා

5. තම දූත මෙහෙවර සනාථ කිරීම සඳහා හාස්කම් කිරීම,

   I). ප්‍රධාන දිවැසිවරුන්ගේ ලක්ෂණයකි. II). සුළු දිවැසිවරුන්ගේ ලක්ෂණයකි.

   III). ලේඛක දිවැසිවරුන්ගේ ලක්ෂණයකි. IV). දේශක දිවැසිවරුන්ගේ ලක්ෂණයකි.

6. "දයාවේ සුභාරංචිය "යන නමින්ද හැඳින්වූ සුවිශේෂ ග්‍රන්ථය වන්නේ ,

   I). ශු.මාක් සුවිශේෂය II). ශු.ලූක් සුවිශේෂය III). ශු.මතෙව් සුවිශේෂය IV). ශු.ජොහාන් සුවිශේෂය

7. රුවන් තම මිතුරාගෙන් පලිගැනීමේ චේතනාව ඇතිව ඔහුව අපහසුතාවයට පත්කරමින් කටයුතු කළේය.මෙහිදී රුවන් විසින් කඩ කරන ලද පනත වන්නේ ,

   I). 8 වන පනත II). 5 වන පනත III). 6 වන පනත IV). කිසිදු පනතක් කඩනොකරන ලදී.

8. දිවස පූජාවේ දක්නට ලැබෙන මුලසුනේ යැදුමකි,

   I). පොදුයැදුම II). ස්වාමිවාක් ආරාධනාව III).ග්ලෝරියා IV). ස්තෝත්‍ර භාගික යැදුම

9. ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රසාදස්නාපන මංගල්‍යයට පසු දින සමරන ඉරු දින සිට අළු බදාදාට පෙරදින දක්වා කාලය අයත් වන්නේ,

I). පාස්කු සමයට II). සාමාන්‍ය සමය පළමු අදියරට III). සාමාන්‍ය සමය දෙවන අදියරට IV). නත්තල් සමයට

10. මයසීදාව ඇතිව දිවි ගෙවූ ශුද්ධවර චරිතයක් වන්නේ,

I). ශු.හෙලේනා තුමිය II). ශු.බර්නදෙක් තුමිය III). ශුඇග්නස් තුමිය IV). ශු.මරියා හෙරෙන්ති තුමිය

11. සුබාරංචි කතුවරුන් හතර දෙනාම වාර්තා කරන එකම ප්‍රාතිහාර්ය වන්නේ,

I). මාරුත දමනය II). පූප වැඩිකිරීමේ ප්‍රාතිහාර්ය

III). අංශභාග රෝගියා සුවපත් කිරීම IV). අතක් පණ නැති මිනිසා සුවපත් කිරීම

12. මැවීමේ කතා පුවත තුළ අත්තික්කා කොළ ඇඳ සිටි මිනිසාට දෙවියන් වහන්සේ හම් වස්ත්‍ර සාදා දීමෙන් පෙන්නුම් කරන්නේ එතුමන් තුළ තිබූ

I). ආදරය,කරුණාව හා බැගෑපත්කමයි II). ආදරය,රැකවරණය හා සමාව දීමයි

III).සමාවදීම,කරුණාව හා ආදරයයි IV). කරුණාව , ආදරය හා රැකවරණයයි

13. මිනිසා තුළ හටගන්නා හයපත හා අයහපත යන්න නිවැරදිව හඳුන්වා දිය හැක්කේ,

I). රුචියට ඇති වහල්භාවය වශයෙනි. II). හොඳ නරක නිවැරදිව හඳුනාගැනීම වශයෙනි.

III).රුචිය පදනම් කරගෙන අප ගන්නා තීරණ වශයෙනි. IV).පාපයන්ට ඇති බැඳීම හා ඉන් නිදොස් වීම වශයෙනි.

14. මිනිසා තුළ ක්‍රෝධය,ඊර්ෂ්‍යාව,පළිගැනීම වැනි ජන්ම පාපී ප්‍රතිඵල ලෝක ආරම්භයේ සිටම ක්‍රියාත්මක වූ බව සනාථ වන්නේ

I). ආදම් හා ඒව පාපයට වැටීම තුළිනි II). කායින් ආබෙල්ව ඝාතනය කිරීම තුළිනි

III). දුෂ්ට ජුදයෝ ජේසුස් වහන්සේ මරණයට පත් කිරීමෙනි IV). මනුෂ්‍යත්වය අද පහත් තත්ත්වයට වැටී තිබීමෙනි

15. කිතුනු අපගේ විශ්වාසයේ මූලාශ්‍රය වන්නේ,

I). ප්‍රේමයෙන් අපට අනාවරණය කරන දෙවියන් වහන්සේය. II). ආබ්‍රහම් තුමාගේ විශ්වාසයේ ජීවිතයයි.

III). අභියෝගාත්මක ජීවිතයකට මුහුණ දුන් මරියතුමියගේ ජීවිතයයි. IV). ශු.ලියවිල්ල තුළ කරන අනාවරණයයි.

පහත 16 - 18 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු පහත සටහන ඇසුරින් සපයන්න.

<u>ශු.ශුභාරංචි හතර</u>

| ශුභාරංචිය | සංකේතය | කාලය හා ස්ථානය | භාවිතාවන වෙනත් නම් |
|---|---|---|---|
| A…………………… | සිංහයා | ක්‍රි.ව 64-66<br>රෝමයේ | F…………………… |
| ශු.මතෙව් | මිනිසා | D……………………<br>සිරියා පලස්තීනයේ | දේව රාජ්‍යයේ ශුභාරංචිය |
| B…………………… | ගවයා | ක්‍රි.ව 80-85<br>සිරියා අන්තියෝකියේ | දිළින්දන්ගේ ශුභාරංචිය |
| C…………………… | රාජාලියා | E……………………<br>එපීසයේ | G…………………… |

16. ඉහත A,B හා C සඳහා යෝග්‍ය පිළිතුරු පිළිවෙලින් ඇතුලත් වන්නේ,

I).ශු.මාක්, ශු.ජොහාන්, ශු.ලූක් II). ශු.ලූක්, ශු.ජොහාන්, ශු.මාක්

III). ශු.මාක්, ශු.ලූක්, ශු.ජොහාන්, IV). ශු.ලූක්, ශු.මාක්, ශු.ජොහාන්

17. ඉහත Dහා E සඳහා යෝග්‍ය පිළිතුරු වන්නේ,

I). ක්‍රි.ව 85-90/ ක්‍රි.ව 95-100 II). ක්‍රි.ව 90-95/ක්‍රි.ව 85-90 III). ක්‍රි.ව 90-100/ක්‍රි.ව 80-90 IV). ක්‍රි.ව 80-90/ක්‍රි.ව 90-100

18. Fහා G සඳහා අදාළ වන පිළිතුරු පිළිවෙලින් ඇතුලත් වන්නේ,

I).අන්‍යජාතීන්ගේ ශුභාරංචිය/ අධ්‍යාත්මික ශුභාරංචිය II). අධ්‍යාත්මික ශුභාරංචිය/ දයාවේ ශුභාරංචිය

III). දුක්ප්‍රාප්තියේ ශුභාරංචිය / අධ්‍යාත්මික ශුභාරංචිය IV).කාන්තාවන්ගේ ශුභාරංචිය /දුක්ප්‍රාප්තියේ ශුභාරංචිය

19. කතෝලික සභා ධර්මෝපදේශය අනුව දේව ප්‍රේමයට විරුද්ධ පාපයක් වන්නේ,

I).උඩගුවෙන් දෙවියන් වහන්සේ ප්‍රතික්ෂේප කිරීම යි. II). දේව නාමය අගෞරව ලෙස භාවිතා කිරීමයි.

III). දේව ප්‍රේමය නිසි පරිදි හඳුනා නොගැනීමයි. IV) දේව ප්‍රේමයට ප්‍රති ප්‍රේමය දැක්වීමයි.

පහත දැක්වෙන්නේ දසපණත කඩ කරන ආකාරයේ පාපී ක්‍රියාවන් කිහිපයකි.

A පොදු දේපල විනාශ කිරීම. B තර්ජනය කිරීම් හා මැර බලය යෙදවීම.

C තමාගෙන් ඉටු විය යුතු යුතුකම් ඉටු නොකිරීම D පරිසරයට හා මිනිසාට අහිතකර ව්‍යාපාර වල යෙදීම.

20. ඉහත වර්ගීකරණයට අනුව පස්වන පණත කඩ කරනු ලබන්නේ ,

I). A හා D මගිනි. II). A හා C මගිනි. III). B හා D මගිනි. IV) C හා D මගිනි.

21. ඉහත වර්ගකිරීම අනුව හතරවන පණත කඩ කරනු ලබන්නේ ,

I). B හා D මගිනි. II). A හා C මගිනි. III). B හා C මගිනි. IV) A හා D මගිනි.

22. ශු.දෙවන ශුවාම් පාවුළු මුනිතුමා ශුද්ධවරයට පත්කරනු ලැබුවේ ,

I). 2005.04.02 දින II). 2011.05.01 දින III). 2014.04.27 දින IV) 2012.03.02 දින

23. දෙවියන් වහන්සේ නෝවා සමග ඇති කරගත් ගිවිසුමේ බාහිර සලකුණ වූයේ ,

I). වළාකුලයි. II). ඇවිලෙන ගිනි පඳුරයි. III). පරවියායි. IV) දේදුන්නයි.

24. දෙවියන් වහන්සේ ආබ්‍රහම්තුමා සමග ඇති කරගත් ගිවිසුම ඉදිරිපත් කරන සම්ප්‍රදායන් දෙක වන්නේ ,

I). J හා P සම්ප්‍රදායන්ය. II). E හා Dසම්ප්‍රදායන්ය III). J හා D සම්ප්‍රදායන්ය. IV) P හා E සම්ප්‍රදායන්ය.

25. නික්මයාම පොතෙහි වන්නේ සඳහන් පරිදි මෝසෙස් තුමාගේ මව චිකුමන්ව කුඩා වියේදී සඟවා තබා ගත් කාලය වන්නේ,

I). මාස 2 කි. II). මාස 3 කි. III). මාස 5 කි. IV) මාස 7 කි.

26. සත් ගුණවත් මිනිසෙකු නිසාත් , දෙවියන් වහන්සේ සමඟ සුහදතාවයෙන් හැසිරුණු නිසාත්,නව මැවිල්ලේ ආරම්භකයා ලෙස දෙවියන් වහන්සේ තෝරාගනු ලැබුවේ,

I). මෝසෙස් තුමාය II). නෝවාය III). ආබ්‍රහම්ය IV) ආදම්ය

27. දෙවියන් වහන්සේ ආදරණීය පියෙක් බවත්,උන්වහන්සේ තම දරුවන්ට නිවැරදි මග යන්නට අවවාද දෙන බවත් පැවසෙන බයිබල් පාඨය වන්නේ,

I).දෙවි සමිඳුන් වහන්සේ වස්ත්‍ර සාදා ආදම්ට හා ඔහුගේ භාර්යාවට හැඳ වූ සේක.

II). ඔබ මාගේ නාමයෙන් අයදින කවර දෙයක් වුවද මම ඉටු කරමි.

III). හොඳ නරක අවබෝධ කරගැනීමේ ගසින් පමණක් නොකෑ යුතුය.

IV) මා නුඹ කුසෙහි පිළිසිඳ ගැනීමටත් පෙර පටන්ම නුඹ හඳුනා ගතිමි.

28. ශු.බයිබලයේ දිවැසිවරුන් ප්‍රධාන හා සුළු දිවැසිවරුන් ලෙස වර්ගීකරණය කිරීමේ පදනම වන්නේ,

I).එක් එක් දිවැසිවර ග්‍රන්ථයෙහි අඩංගු සත්‍යතා ප්‍රමාණයයි. II). එක් එක් දිවැසිවරයා ලද කැඳවීමේ ස්වභාවයයි.

III). එක් එක් දිවැසිවරයා සතු රචනාමය කුසලතාවයයි. IV) එක් එක් දිවැසිවර ග්‍රන්ථයේ විශාලත්වයයි.

29. ජේසුස් වහන්සේ අන්තිම රාත්‍රි භෝජනයේදී සිදු කළ කාර්යයක් නොවන්නේ,

I).පූජකවරය ස්ථාපිත කිරීම II). දිව්‍යසත්ප්‍රසාද වහන්සේ ස්ථාපිත කිරීම

III).ශ්‍රාවකයන්ගේ පව් සමා කිරීම IV) උත්තම පූජක යාච්ඤාව තුළින් දෙව් පියාණන්ට යාච්ඤා කිරීම

30. ක්‍රිස්තුස් වහන්සේගේ උත්තම පූජක යාච්ඤාව පුරා දිවයන එක් තේමාවක් වන්නේ,

I).ප්‍රේමයයි II). විශ්වාසයයි. III).බෙදාගැනීමයි IV) එකමුතුකමයි

31. දිව්‍ය පූජාවේ ආරම්භක පිළිවෙතට අදාල කොටස් පමණක් ඇතුලත් වන්නේ,

I).ඇතුළුවීමේ ගීතිකාව,පොදු යැදුම, සුරදූත ගීය

II). ආචාරය,නමස්කාරය,සාධුකාරය, පොදු යැදුම

III).හැඳින්වීම, සුරදූත ගීය,සුභාරංචි ප්‍රකාශය ,ආචාරය

IV) පශ්චත්තාපිත පිළිවෙත,ස්තෝත්‍ර යාගික යැදුම, සුරදූත ගීය, පොදු යැදුම

පහත සඳහන් වන්නේ ශු.බයිබලයේ පංච පුස්තකය රචනා වී ඇති සම්ප්‍රදායන් වලට අදාල ලක්ෂණ කිහිපයකි.

A යොදාගන්නා සාහිත්‍යමය භාෂා ශෛලිය කතාන්දර ස්වරූපයක් ගනී.

B විවිධත්වයකින් හා නාට්‍යමය ලක්ෂණ වලින් යුක්තය.

C සාහිත්‍යමය ශෛලිය කෙටිය,සෘජුය.

D භාෂා ශෛලිය අනුභාසාත්මකය.

E දෙවියන් වහන්සේ මිනිසාට කතා කරනුයේ දර්ශන,සිහින,දේවදූතයන් මගිනි.

32. ඉහත ලක්ෂණ අතුරින් (J) යාවේ සම්ප්‍රදායට ආවේණික ලක්ෂණය වන්නේ,

I) C හා D පමණි II) A හා B පමණි III) A,B හා D පමණි IV) A හා E පමණි

33. ඉහත ලක්ෂණ අතුරින් (E) එලෝහිම් සම්ප්‍රදායට අයත් ලක්ෂණය වන්නේ,

I) A හා B පමණි II) C හා D පමණි III) C හා E පමණි IV) B හා E පමණි

34. ඉහත ලක්ෂණ අතර ඇති D ලක්ෂණය අයත්වන සම්ප්‍රදාය වන්නේ,

I) J සම්ප්‍රදායටයි. II) E සම්ප්‍රදායටයි. III) D සම්ප්‍රදායටයි. IV) P සම්ප්‍රදායටයි.

36. "ගව ගිවිසුමෙහි කතුවරුන් ග්‍රන්ථ ලේඛන ගත කිරීමේදී බොහෝවිට භාවිතා කර ඇත්තේ ග්‍රීක පිටපතයි. "මෙමගින් සනාථ වන්නේ,

I). ද්විතීය සම්මත ග්‍රන්ථ දේවානුභාවයෙන් ලිය වී ඇති බවයි.

II). හෙබ්‍රෙව් ලියවිල්ල පසු කලෙක ග්‍රීක බසට පරිවර්තනය වූ බවයි.

III). ග්‍රීක පිටපත අන් පිටපත් වලට වඩා සුවිශේෂී වූ බවයි.

IV). කතෝලික බයිබලයට පොත් 46 ලැබුනේ ග්‍රීක පිටපතින් බවයි.

37. "මා ලාබාලයෙකු වන බැවින් මම කථා කරන්නට නොදනිමි"යනුවෙන් පවසමින් දේව කැමැත්තට විවෘත නොවූයේ,

I). මෝසෙස් තුමාය II). ජෙරමියා දිවැසිවරයාය III). යෙසායා දිවැසිවරයාය IV). එසකියෙල් දිවැසිවරයාය

38. පහත වරණයන් අතුරින් සුළු දිවැසිවරු පමණක් ඇතුලත් වන්නේ,

I). මීකා,නාහුං,මලාකි.ජෝනා II). අභියා,ඔබදියා,හග්ගායි,ජෝවෙල්

III). හොසියා,එලිෂා,මලාකි,ශෙපනියා IV). එලිගා, මීකායා,ආමෝස්,ඔබදියා

39. 1985 දී ඒඩ්ස් රෝගීන් සඳහා පළමු නිවහන නිව්යෝක්හි විවෘත කිරීමට දායක වූයේ,

I). දෙවන ජුවාන් පාවුළු මුනිතුමාය II). ශු.තෙරේසා මුනිවරියයි

III). ගරු මයිකල් රුදිගු පියතුමා IV). ශු.මැක්සිමිලියන් කෝල්බේ මුනිතුමාය

40. මල් උයනේ යාච්ඤාව මගින් අපට ඉදිරිපත් කරන ප්‍රබල පණිවුඩය වන්නේ,

I). ජීවිතයේ සෑම වැදගත් අවස්ථාවකටම යාච්ඤාවෙන් සූදානම් විය යුතු බව

II). යාච්ඤාව කිතුනු දිවියේ ප්‍රබලතම ආයුධය වන බව

III). එය අප යාච්ඤාවට පරමාදර්ශයක් කරගත යුතු බව

IV). යාච්ඤාව තුල අපට ඕනෑම අභියෝගයක් ජය ගත හැකි බව

## II කොටස

පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න

01. කෙටි පිළිතුරු සපයන්න (ල. 2 x 10 = 20 )

1.කතෝලික සභාව පිළිගත් සභා හත අතුරින් දෙකක් ලියන්න.

2.ජනවන්දනා වසරෙහි කොළ හා දම් වර්ණයන් භාවිතා කරනුයේ කුමන කාල වකවානු වලද?

3.මිසරවාසීන් මුහුණ දුන් පළමු හා දෙවන වසංගත පිළිවෙලින් ලියන්න.

4.මැවීමේ කතා පුවත් දෙක ලේඛන ගත වූ සම්ප්‍රදායන් මොනවාද?

5.බලාපොරොත්තුවට විරුද්ධ පාපයන් දෙකක් වන්නේ මොනවාද?

6.දිව්‍ය සත්ප්‍රසාදිය ලක්ෂණ දෙකක් ලියන්න

7.ශු.ලූක් ශුභාරංචිය යාච්ඤාවේ ශුභාරංචිය ලෙස හැඳින්වීමට හේතු දෙකක් ලියන්න.

8.දේශක දිවැසිවරුන් සතුව තිබූ ලක්ෂණ දෙකක් ලියන්න.

9.ද්විතීය නීති සම්ප්‍රදායට (D) අයත් සුවිශේෂී ලක්ෂණ දෙකක් ලියන්න

10.දෙවියන් වහන්සේ ආබ්‍රහම් තුමාට දුන් පොරොන්දු දෙකක් ලියන්න.

02. I. ජනවන්දනාව යන්න කෙටියෙන් හඳුන්වන්න.

II. ජනවන්දනාවේ ප්‍රධාන අංග 03 ලියන්න.

III. චතාරික සමය තුළ සැබෑ ජීවිත වෙනසක් ඇති කර ගැනීම සඳහා ඔබට කළ හැකි කාර්යයන් 05 ක් ලියන්න.

03. I. ශු.බයිබලයේ ඉශ්‍රායෙල් දිවැසිවරු බෙදෙන ප්‍රධාන කොටස් දෙක ලියන්න.

II. ශු.බයිබලයේ ප්‍රධාන දිවැසිවරු තිදෙනා නම් කරන්න.

III. "මෙන්න මා මෙහිය,මා යැව්ව මැනව" යනුවෙන් යෙසායා දිවැසිවරයා දෙවිඳු හඬට පිළිතුරු දුන්නා සේ, ඔබත්, කිතුනු දරුවකු ලෙස දිවැසිවර කාර්යයට දායක වන ආකාර 05 ක් ලියන්න.

04. I. මිනිසා අන් මැවිලි වලට වඩා උසස් වීමට බලපාන කරුණු 3 කි. ඉන් දෙකක් ලියන්න.

II. වරදට වැටුණු මිනිසාට දෙවියන් වහන්සේ දඬුවම් කළ සේක. එහිදී ඒවට, ආදම්ට හා කායින්ට දුන් දඬුවම් එක බැගින් වගු ගත කරන්න.

| | | |
|---|---|---|
| ඒවට | උත්:3/16 | |
| ආදම්ට | උත්:3/17-19 | |
| කායින්ට | උත්:4/11-12 | |

III. නිරතුරුවම වරදෙහි බැඳෙන ඔබට හරිමග යාම සඳහා අවවාද දෙන පාර්ශවයන් අතුරින් 5ක් නම් කර, ඔවුන්ගේන් ඔබ ලද අවවාදය බැගින් ලියන්න.

05. I. මිසරයේ රජතුමා ඉශ්‍රායෙල් ජනතාව වර්ධනය වීම මර්ධනය කිරීම සඳහා අනුගමනය කළ ක්‍රියා මාර්ග දෙකක් ලියන්න.

II. ඉශ්‍රායෙල් ජනතාව නික්ම යාම ගමන තුළ දිව්‍ය සංරක්ෂණය අත්දුටු අවස්ථා 3 ක් ලියන්න.

III. අද සමාජයේ තරුණ පිරිස් වහල් වි සිටින වහල් භාවයන් 5 ක් නම් කර ඉන් මිදීමට ගත යුතු ක්‍රියාමාර්ග සැකෙවින් විස්තර කරන්න.

06. I. ජේසුස් වහන්සේ තම ජීවිතය තුළ යාච්ඤා කළ අවස්ථාවන්ට උදාහරණ දෙකක් ලියන්න.

II. ක්‍රිස්තුත් වහන්සේගේ මල් උයනේ යාච්ඤාවෙන් පෙන්නුම් කරන කරුණු තුනක් ලියන්න.

III. යාච්ඤාව ඔබගේ ජීවිතයේ දෛනික අංගයක් බවට පත්කර ගැනීමට ඔබ කරන ක්‍රියාවන් පහක් ලියන්න.

07. "පාසල් වයසේ පසුවන සිරිමල් දැඩිලෙස අසභ්‍ය පොතපත හා අන්තර්ජාල වෙබ් අඩවි නැරඹීමට පෙළඹී ඇති අතර අවසානයේ ප්‍රේමයෙන් පරාජය වීම නිසා සියදිවි නසා ගැනීමට ද තැත් කළේය "

I. ඉහත සිදුවීමට අදාලව සිරිමල් විසින් කඩ කරනු ලැබූ දේව පණත් දෙකක් ලියන්න.

II. මයසිදාව හෙවත් ව්‍රතශුද්ධිය යනු කුමක්ද? ඒ අනුව දිවි ගෙවන්නට නම් ඔබ විසින් කළ යුතු ක්‍රියාවන් දෙකක් ලියන්න.

III. කතෝලික සභාධර්මෝපදේශයට අනුව ජීවිතය හා ශරීර සෞඛ්‍යය දෙවියන් වහන්සේගෙන් ලද අමිල දීමනාය. ඒ අමිල වූ ශරීරය නිරෝගීව පවත්වා ගන්නට ඔබ විසින් කළ යුතු දේවල් පහක් උදාහරණ දෙමින් විස්තර කරන්න.

08. පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් සඳහා කෙටි සටහන් ලියන්න.

I. ජනවන්දනා වසරේ පාස්කු සමය

II. පළමුවන දේව පණත

III. ශු.පේදුරුතුමාගේ කැඳවීම

IV මැවීම පිළිබඳ පළමු කතාව

V ශු.ලූක් සුභාරංචිය